# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| දිනය | : | 2023.01.12 |
| වේලාව | : | පෙ.ව.9.00 |
| ස්ථානය | : | ප්‍රධාන ලේකම් රැස්වීම් ශාලාව |
| **මූලාසනය** | : | **ප්‍රදීප් යසරත්න මහතා (ප්‍රධාන ලේකම්)** |

**සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය**

| | | | |
|---|---|---|---|
| 01) | පී.සෝමසිරි මහතා | - | ආණ්ඩුකාර ලේකම් |
| 02) | තිලක් සෙනරත් මහතා | - | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන්සභාව(බ.ප) |
| 03) | යූ.බී.ආර්.රාජපක්ෂ මහතා | - | සභා ලේකම්,සභා ලේකම් කාර්යාලය(බ.ප) |
| 04) | ඒ.ඩී.එස්.සදීකා මිය | - | ලේකම්,පළාත් පාලන අමාත්‍යංශය(බ.ප) |
| 05) | සිරිසෝම ලොකුවිතාන මහතා | - | ලේකම්,අධ්‍යාපන අමාත්‍යංශය(බ.ප) |
| 06) | කේ.චම්පා එන්. පෙරේරා මිය | - | ලේකම්,ප්‍රවාහන හා මාර්ග අමාත්‍යංශය(බ.ප) |
| 07) | ගාමිණී ධර්මසේන මහතා | - | ලේකම්,සෞඛ්‍ය අමාත්‍යංශය(බ.ප) |
| 08) | චන්දන රණවීර ආරච්චි මහතා | - | ලේකම්,කෘෂිකර්ම අමාත්‍යංශය(බ.ප) |
| 09) | ඩබ්ලිව්.ටී.ඒ.මානෙල් මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 10) | ඒ.එම්.එස්.මල්කාන්ති මිය | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 11) | කේ.ඒ.ඩී.කේ.සිරිවර්ධන මහතා | - | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) |
| 12) | ආශා පනාගොඩ මිය | - | අධ්‍යක්ෂ(ඉංජිනේරු) |
| 13) | ආර්. පී. ගුණවර්ධන | - | අධ්‍යක්ෂ (ගොඩනැගිලි) |
| 14) | පාලිත අබේවර්ධන මහතා | - | ප්‍රධාන නීති නිලධාරී |
| 15) | කේ.එන්.සූරියආරච්චි මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |
| 16) | පේෂලා අබේසූරිය මිය | - | සහකාර ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති ලේකම්වරුන්ගේ රැස්වීමේදී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ට එළඹෙන ලදී.

| අනු අංක ය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01 | කෘෂිකර්ම ව්‍යාපෘති සිදුකිරිම සම්බන්ධව | 2023 වර්ෂය සඳහාද ගෙවතු වගා තරඟාවලියක් පැවැත්වීමට කටයුතු කිරීම සම්බන්ධව ප්‍රධාන ලේකම් විසින් අවධානය යොමු කල අතර ඒ අනුව ග්‍රාමීය / නාගරික වශයෙන් හා ආයතන වශයෙන් කොටස් කර මෙම තරඟාවලිය පැවැත්වීමට ඉදිරි කටයුතු සාකච්ඡා කිරිම සඳහා යෝජනාවක් සති දෙකක් තුල ඉදිරිපත් කරන ලෙස කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී.<br>තවද පුරන් කුඹුරු සම්බන්ධව කටයුතු සිදු කිරීම , මහා කන්නයේ වගා කටයුතු හා පොහොර ලබා දීම , ගොවි පොළවල් අධීක්ෂණය කිරීමේ කටයුතු සිදු කිරීම ගම්පහ දිස්ත්‍රික්කයේ සමහර කොට්ඨාසවල කිරි පට්ටිවල ගවයින් අතුරුදන් වීමේ ගැටළු , ගොවි පොළවල් වල සතුන්ට ආහාර පාන ලබා දීම ආදී කටයුතු සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කරන ලදී. ඒ අනුව එම ගැටළු සම්බන්ධව අදාළ නිලධාරීන් දැනුවත් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙසද දැනුම් දෙන ලදී. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 02 | We green වෙළඳසැල පවත්වාගෙන යාම කෘෂි සේවා අධිකාරියට පැවරීම සම්බන්ධව | We green වෙළඳ සැල පවත්වාගෙන යාම සඳහා කෘෂි සේවා අධිකාරිය වෙත ලබා දීමට තීරණය කරන ලදී. එම වෙළඳ සැල නැවත ආරම්භ කිරීම ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කිරීම සුදුසු බවත් ඒ සඳහා දිනයක් ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් ජනවාරි මස අවසන් වන විට මෙම කාර්යය සිදුකර අවසන් කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් වෙත උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 03 | බස්නාහිර පළාත් ගුරු විභාග අයදුම් කරුවන්ගෙන් අයකල විභාග ගාස්තු ආපසු ගෙවීම සම්බන්ධව | බස්නාහිර පළාත් පාසැල් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේ විභාගයට අයදුම්පත් කැඳවූ නමුත් විභාගය නොපැවැත්වූ බැවින් අයදුම්කරුවන්ගෙන් අයකරන ලද විභාග ගාස්තු කඩිනමින් ඔවුන් වෙත ආපසු ගෙවීමට කටයුතු කරන ලෙසත් , නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) සමඟ සම්බන්ධීකරණය වෙමින් එය නැවත ලබා දීමට කටයුතු කරන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) |
| 04. | කඩුවෙල කොරතොට මයින්වත්ත ඉඩම සම්බන්ධව<br>ලේඛනය පිටපත<br>ඇනුව ඔපිනාන්කී - මිඟුම ඉෂ්ථන | මෙම ඉඩම අත්පත්කර ගැනීමේ මූලික අරමුණ වූ නිවාස සංකීර්ණයක් ඉදි කිරීම සම්බන්ධයෙන් නැවතත් අවධානය යොමු කරන ලෙසත් ඒ අනුව ඉදිකිරීම් කටයුතු සඳහා රාජ්‍ය - පුද්ගලික ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කිරීම කෙරෙහි සලකා බැලීමටත් පළාත් සභා නිලධාරීන් වෙනුවෙන් ද එහි නිල නිවාස වෙන් කිරීම කෙරෙහිඅවධානය යොමු කිරීම සුදුසු බවත් සාකච්ඡා විය. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන / ඉංජිනේරු/ සැලසුම්) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 05. | අලෙවි කටයුතු සඳහා ප්‍රධාන පිවිසුම් ආලින්දය භාවිතා කිරීම සම්බන්ධව | ප්‍රධාන පිවිසුම් ආලින්දය අලෙවි කටයුතු සඳහා ඵලදායී අයුරින් යොදා ගැනීම සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් යෝජනාවන් ඊළඟ ලේකම්වරුන්ගේ රැස්වීමට ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |
| 06. | 2023 වර්ෂයේ සංවර්ධන සැලැස්ම සම්බන්ධව | මේ වන විට 2023 වර්ෂයට අදාළ සංවර්ධන සැලැස්ම සකස්කර ඇත. ඒ අනුව මෙම සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සියලු අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා එම ආයතන වලට අයත් අධිකාරී සමඟ සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී.ඒ සඳහා දින යොදා ගැනීමට උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |
| 07. | 2023 වසර සඳහා වන පුහුණු සැලැස්ම සම්බන්ධව | පසුගිය වසර කිහිපය තුල රටේ පැවති වාතාවරණය මත සේවක පුහුණු වැඩසටහන් පැවැත්වීමේ හැකියාවක් නොතිබූ අතර 2023 වර්ෂයේ පුහුණු වැඩසටහන් පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර ඇති බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) විසින් ප්‍රකාශ කරන ලදී.<br>සියලුම අමාත්‍යාංශ හා අනිකුත් ආයතනවල පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව එම ආයතන වලට ගැලපෙන පරිදි පුහුණු පාඨමාලාවන් සංවිධානය විය යුතු බවට ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br>ඒ අනුව සියලු ලේකම්වරුන්ට තම පුහුණු අවශ්‍යතා සති දෙකක් ඇතුලත ඉදිරිපත් කරන ලෙසත් ඒ අනුව සෑම ආයතනයකටම ගැලපෙන පරිදි පුහුණු වැඩසටහන් සකස් කිරීමට කටයුතු කරන ලෙසත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) වෙත දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br><br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 08. | කළුතර ආදායම් දෙපාර්තමේන්තුවට අයත් නව ගොඩනැගිල්ලේ කාර්යාල ස්ථාපිත කිරීම සම්බන්ධව | බස්නාහිර ආදායම් දෙපාර්තමේන්තු සඳහා කළුතර ඉදිකරන ලද නව ගොඩනැගිල්ලේ භාවිතයට ගෙන නොමැති මහල්වල කාර්යාල ස්ථාපිත කිරීම සම්බන්ධව සාකච්ඡා කරන ලදී.<br>කළුතර කලාප අධ්‍යක්ෂ කාර්යාලය මෙම ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට ප්‍රමාණවත් ඉඩක් නොපවතින බව අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් පෙන්වා දුන් අතර පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය (PRDA) විසින් කාර්යාලයක් ස්ථාපිත කිරීමට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බවත් , අනිකුත් අමාත්‍යාංශ වලටද එම ගොඩනැගිල්ලේ තම ප්‍රාදේශිය කාර්යාල ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවයක් පවතින්නේ ද යන්න පරීක්ෂාකර බලා සති දෙකක් ඇතුලත තම ඉල්ලීම් ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 09. | 2023 පළාත් පාලන මැතිවරණ කටයුතු සම්බන්ධව | පළාත් පාලන මැතිවරණ කටයුතු සිදුකරන සමය තුල සේවක ස්ථාන මාරු සිදු කිරීමට නොහැකි බව දන්වා ඇති නමුත් සේවා අවශ්‍යතාවය මත සේවක ස්ථාන මාරු ලබා දීමේ හැකියාව පවතින බව ප්‍රධාන ලේකම් විසින් පෙන්වා දෙන ලදී.<br>එසේම මැතිවරණ කොමිෂන් සභාව වෙතින් ලබාදෙන නියෝග නිවේදන නැවත පළාතට අදාළ කර ගැනීමක් සිදු නොකරන අතර ඒ ආකාරයටම ලබා දෙන උපදෙස් ක්‍රියා කිරීම සුදුසු බව පෙන්වා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 10. | ගම්පහ ශ්‍රී බෝධි ක්‍රීඩාංගනයේ ගැටළුව සම්බන්ධ | ගම්පහ දිස්ත්‍රික්කයේ ශ්‍රී බෝධි ක්‍රීඩාංගනය සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයට හිමිකමක් නොමැති බැවින් එහි කිසිදු ආයෝජනයක් සිදු නොකරන ලෙස විගණන අංශය දන්වා ඇති බවත් , නමුත් කලින් එම භූමියෙහි ආයෝජන සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය මඟින් මුදල් වැය කර ඇති බවත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු දක්වන ලදී.<br>මෙම ක්‍රීඩාංගනය පළාත් සභාවේ අයිතියට ලබා ගැනීම සඳහා කටයුතු කිරීමට අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීමට තීරණය කරන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශ |
| 11. | පළාත් සංස්කෘතික අංශයේ කටයුතු ක්‍රියාත්මක කිරීම | පසුගිය සමය තුල රටේ පැවත් විවිධ ගැටළුකාරී තත්ත්වයන් මත පළාත් සංස්කෘතික අංශයේ කටයුතු සඳහා කිසිදු දායකත්වයක් ලබා දීමට නොහැකි වූ බවත් , ඒ මඟින් සෑම වසරකම පවත්වන ගම්මඩු , දෙවොල් මඩු , ආදී ශාන්ති කර්මයන් සඳහා මුදල් වෙන්ව ඇති අතර නැවත වරක් ඒවා ආරම්භ කිරීම පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් කරුණු දක්වා සිටින ලදී.<br>මෙම වසරේ සංස්කෘතික අංශයේ කටයුතු පෙර පරිදි ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කල යුතු බවට ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br>බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන කාර්යාල හා සංස්කෘතික අංශය සමඟ ඒකාබද්ධව ගුරුවරුන්ගේ හැකියාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා තරඟාවලියක් පැවැත්වීමට ප්‍රධාන ලේකම් විසින් යෝජනා කල අතර අමාත්‍යාංශ ලේකම් හා පළාත් සංස්කෘතික අධ්‍යක්ෂ හට ඒ පිළිබඳ සාකච්ඡා කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී.<br>එසේම ගරු ආණ්ඩුකාරතුමාගේ අදහසක්ද අනුව බස්නාහිර පළාත් නිලධාරීන්ගේ ක්‍රීඩා කෞශල්‍ය වැඩිදියුණු කිරීම හා ආණ්ඩුකාර කුසලාන ක්‍රීඩා තරඟාවලියක් පැවැත්වීම ද මේ වසරේ සිදුකල යුතු බව ප්‍රධාන ලේකම් ප්‍රකාශ කරන ලදී.ඒ සඳහා පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන ,ක්‍රීඩා අමාත්‍යාංශ ලේකම් හට ප්‍රධාන ලේකම් සමඟ සාකච්ඡා කර වැඩ සටහනක් සකස් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 12. | දුරකතන ඇමතුම්වලට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධව | දුරකතනවලට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධව අවධානය යොමු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී.<br>ඒ අනුව දුරකතන දීමනාව ලබා ගන්නා සියලුම මාණ්ඩලික නිලධාරීන් ඒ පිළිබඳ අවධානයෙන් කටයුතු කල යුතු බව සියලුම නිලධාරීන් දැනුවත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 13. | සේවා ලාභීන් ඇතුළු විවිධ කටයුතු සඳහා පැමිණෙන මහජනතාව නිලධාරීන් හමුවීම සම්බන්ධයෙන් | සියලුම අමාත්‍යාංශවලට විවිධ අවශ්‍යතාවයන් සඳහා පැමිණෙන මහජනතාවට බාධාවකින් තොරව නිලධාරීන් හමුවීම සඳහා අවස්ථාව සලසා දීමට කටයුතු සලසන ලෙස උපදෙස් ලබා දෙන ලදී.ඒ සඳහා සියලුම නිලධාරීන් දැනුවත් කරන ලෙසද ප්‍රධාන ලේකම් දන්වන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 14. | කාර්ය සාධන තරගාවලිය පැවැත්වීම | කාර්ය සාධන තරගාවලිය පැවැත්වීම සඳහා 2020 වසරේ සිට සාකච්ඡා කරන නමුත් රටේ පැවති වාතාවරණය මත කාර්යාලය තුල පැවති තත්ත්වය එයට බාධාවක් වූ බවත් 2023 වසරේ එම තරගාවලිය පැවැත්වීම කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු බවටත් ආණ්ඩුකාර ලේකම් විසින් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 15. | බස්නාහිර පළාත් සභාවට FB ගිණුමක් සකස් කිරීම සම්බන්ධව | බස්නාහිර පළාත් සභාවට අයත් සියලුම අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ආයතන ඇතුලත්වන පරිදි FB ගිණුමක් නිර්මාණය කිරීම කෙරෙහි ප්‍රධාන ලේකම් විසින් අවධානය යොමු කරන ලදී.<br>ඒ අනුව මෙම කාර්යය තොරතුරු තාක්ෂණ සම්පත් අධිකාරියට පැවරීමටත් සති දෙකක් ඇතුලත මෙම කාර්ය නිමකල යුතු බවත් අවධාරණය කරන ලදී.<br>බස්නාහිර පළාත් සභාවේ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන මඟින් සිදු කරනු ලබන වැඩසටහන් එම ගිණුමෙහි ඇතුලත් කිරීම සඳහා ආයතන මට්ටමින් නිලධාරියෙකු නම් කර තොරතුරු තාක්ෂණ ඒකකය හා සම්බන්ධ කරන ලෙසත් 2023 ජනවාරි 16 දින මේ සම්බන්ධව තමා සමඟ සාකච්ඡා කරන ලෙස ජගත් ප්‍රියන්ත මහතා වෙත දන්වන ලෙසත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු<br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

[illegible]

| | | | |
|---|---|---|---|
| 16. | දේශීය හා විදේශ නිවාඩු ලබා ගන්නා නිලධාරීන්ගේ ණය අයකර ගැනීම සම්බන්ධව | නිලධාරීන් දේශීය හා විදේශ නිවාඩු ලබා ගැනීමේදී ඒ සඳහා පත් කරන ලද කමිටුවක් මඟින් නිර්දේශ ලබා දිය යුතු අතර ඒ සඳහා නිලධාරීන් ලබා ගෙන ඇති ණය අයකර ගැනීම සම්බන්ධ ගැටළුවක් පවතින බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් අවධාරණය කරන ලදී.<br>ඒ අනුව කමිටුව මඟින් වසර දෙකක් සඳහා පමණක් බැංකුවට ණය ගෙවීමෙන් ඔවුන් නිදහස් කරන අතර එම වසර දෙකක කාලය ඉකුත් වීමෙන් පසුව එම නිලධාරීන් නැවත නොපැමිණියහොත් බැංකුව වෙත ණය වාරික ගෙවීමේ ගැටළුවක් මතුවන බැවින් ඒ සම්බන්ධව කමිටු නිලධාරීන්ගේ අවධානය යොමු කිරීමට ඔවුන් දැනුවත් කිරීමට කටයුතු කල යුතු බව වැඩි දුරටත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් ප්‍රකාශ කරන ලදී.<br>ඒ අනුව මේ පිළිබඳ දැනුවත් කිරීම සඳහා කමිටු නිලධාරීන්ට ඒ පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම සුදුසු බවට තීරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් පුහුණු) |
| 17. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා ලබා දීම සම්බන්ධව | චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ සඳහා ශාඛා නොමැති කාර්යාල වෙන්දේසි ආදිය පවත්වා ජනවාරි අවසාන වන විට භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිම කර පසු කටයුතු පෙබරවාරි මස අවසන් කොට 2023.03.16 වන දින වන විට අවසාන තොරතුරු ලබා දිය යුතු බව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් දැනුවත් කරන ලදී.<br>එමෙන්ම ශාඛා කාර්යාල ඇති ආයතන සඳහා මෙම අවසාන වාර්තාව ජූනි මස 15 වෙනි දින දක්වා ලබා දීමට හැකියාව පවතින බවත් වැඩි දුරටත් දැනුවත් කරන ලදී.<br>ඒ අනුව මේ සම්බන්ධව අමාත්‍යාංශ යටතේ ඇති සියලුම දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන ප්‍රධානීන් දැනුවත් කරන ලෙස උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු<br>සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 18. | අවසන් ගිණුම් ඉදිරිපත් කිරීම සම්බන්ධව | සියලුම ආයතන 2023.02.28 දිනට අවසන් ගිණුම් සකස්කර ඉදිරිපත් කලයුතු බවත් , තාක්ෂණික ගැටළු වැනි හේතු මත එය පැහැර නොහරින ලෙසත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) විසින් අවධාරණය කරන ලදී.<br>අවසන් ගිණුම් වාර්තා පිළියල කිරීමේ තරඟාවලියට ඉදිරිපත් වීම සඳහා නිලධාරීන් සූදානම් කිරීමට ඒ පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීමට බලාපොරොත්තු වන බවත් තරඟාවලිය සඳහා ඉදිරිපත් කිරීමට සියලුම ආයතන වලින් අවසන් ගිණුම් සකස්කර ලබා දෙන ලෙස වැඩි දුරටත් දන්වා සිටින ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |

ප්‍රදීප් යසරත්න
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

| | | | |
|---|---|---|---|
| 19. | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ගණකාධිකාරී නොමැති වීමේ ගැටළුව සම්බන්ධව | පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ගිණුම් කටයුතු පවත්වාගෙන යාම සඳහා ගණකාධිකාරීවරයෙකු නොමැති වීමේ ගැටළුවක් පවතින බවට පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.<br>ඒ අනුව එම තනතුරේ රාජකාරී කටයුතු සිදු කිරීම වෙනුවෙන් රු.10000 ක දීමනාවක් ලබා දීමට අනුමැතිය සඳහා ඉදිරිපත් කල නමුත් මාසිකව රු .4000 ක දීමනාවක් පමණක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ මඟින් අනුමත වී ඇති බැවින් එවැනි දීමනාවකට ගණකාධිකාරීවරයෙකු යෙදවීමේ ගැටළුවක් පවතින බව සාකච්ඡා කරන ලදී.<br>තවද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අයදුම්පත් කැඳවීම ආදී කටයුතු අන්තර්ජාලය හරහා online ක්‍රමවේදය ඔස්සේ සිදු කරන අතර එම කටයුතු සඳහා තොරතුරු තාක්ෂණ නිලධාරියෙකු නොමැති වීමේ ගැටළුවක් පවතින වැඩි දුරටත් දන්වා සිටින ලදී.<br>ඒ අනුව මෙම පවතින අඩුපාඩු සම්බන්ධ තොරතුරු තමා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පැමිණීමට බලාපොරොත්තු වන දිනයේදී තමා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |

ප්‍රදීප යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.